# හොල්මන් අවතාර පිළිබඳ බෞද්ධ විවරණය

වල්පිට ඉන්දරතන හිමි[1]

මිනිස් සිත යම් ආකාරයක කැළඹීමකට පත් කරවන අධිමානසික බලවේගයක් හොල්මන් අවතාර වශයෙන් පිළිගැනේ. පිරිසක් මෙහි සත්‍යතාවයක් ඇති බව පිළිග න්නා අතර තවත් පිරිසක් මායාවකැයි බැහැර කරති. පොදු ව්‍යවහාරයේ මේ පිළිබඳව ඇත්තේ බියමුසු ආකල්පයකි. වර්තමානයේ අධි තාක්‍ෂණික උපකරණයන්ගේ ද සහය ඇතිව පරීක්‍ෂණ පවත්වන මෙහි අතීතය මානව ඉතිහාසයේ ආරම්භයට ම දිව යයි. අතීතයේ පටන්ම නොයෙක් ක්‍රමෝපායන්ගෙන් පර්යේෂණ සිදු කෙරුණ ද මේ පිළිබඳ ඒකමතික නිගමනයක් නොමැත. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ මේ සම්බන්ධව බුදු සමය දක්වන ආකල්පය පිළිබඳ විමසා බැලීමට ය.

බුදුසමය මරණයෙන් පසුව පුද්ගලයාට නැවත උපතක් ඇති බව පිළිගනී. උපතත් මරණයත් අතර කාලාවකාශයක් පිළිබඳව ඍජු ප්‍රකාශන මුල් බුදුසමය තුළ දක්නට නැත. එබැවින් ප්‍රස්තුත හොල්මන් අවතාර මරණයත් උපතත් අතර කාලසීමාවකට අයත් ය යන්න ප්‍රතික්‍ෂේප වේ. බුදුසමය තුළ හොල්මන් අවතාර සම්බන්ධ සිදු වීම් රාශියක් පාරාජිකපාළිය, පෙතවත්ථු, විමානවත්ථු, ජාතකපාළිය, සංයුත්ත නිකාය ඇතුළු සූත්‍ර පිටකයේ බොහෝ තැන්වල සඳහන් වේ. ඒවායෙහි එම සිදුවීම් සඳහන් වන්නේ අමනුස්ස බලපෑම් වශයෙනි. එසේ නම් "අමනුස්ස සංකල්පය" මෙහිදී ඉතා වැදගත් බව පෙනේ..

බුදුරජාණන් වහන්සේ සත්ත්වයන් පහළ වන භූමි තිස් එකක් පිළිබඳ ව කරුණු සඳහන් කොට ඇත. ඒවා කාම භව, රූප භව හා අරූප භව වශයෙන් ප්‍රධාන ප්‍රභේද තුනකි. මෙයින් ප්‍රස්තුත කාරණාවට අදාළ වන්නේ කාම භවය පමණි. කාම භවිකයන් පහළ වන ලෝක එකොළහක් පිළිබඳව සඳහන් වේ. එනම් දිව්‍යලෝක සය, මනුෂ්‍ය ලෝකය හා අපාය සතර යි. මෙකී කාම භවිකයන් අතර මිනිසුන් හා තිරිසන් සතුන් හැරුණු කොට ඉතිරි ජීවීන් සියුම් පදාර්ථවලින් සැදි ශරීර දරන්නන් බව බුදුසමය පෙන්වා දෙයි.

දිව්‍යලෝක සයෙහි ජීවීන්ගේ ශරීර ප්‍රියජනක වුව ද අපාය සතරෙහි ජීවීන් විරූපි වූවන් ලෙස දැක්වේ. මේ ජීවීන් අතර ප්‍රේත ජීවී කොට්ඨාස වැදගත් වේ. පරදත්තූපජීවී, ඛුප්පිපාසිත, නිජ්ඣාමතණ්හික හා කාලකඤ්ජික වශයෙන් ඔවුන් ප්‍රධාන කොටස් සතරකි. කාලකඤ්ජික අසුර නමින් තවත් කොටසක් පිළිබඳව සඳහන් වේ. සාමාන්‍ය ව්‍යවහාරයේදී ඔවුන් "යක්‍ෂ" නමින් හඳුන්වනු ලැබේ. මොවුන්ගෙන් මිනිසුන්ට නොයෙක් ආකාරයෙන් බලපෑම් සිදු වූ අවස්ථා සූත්‍ර දේශනාවන්හි සඳහන් වේ. රහතන් වහන්සේලා වැනි උසස් මනස් ඇත්තවුනට ඔවුන් හා සම්බන්ධ විය හැකි අතර උක්ත අමනුෂ්‍ය කායිකයන්ට තමන් අභිමත රූප මවා ගැනීමේ හැකියාවක් ද ඇත. එලෙස මවාගත් රූප ආශ්‍රයෙන් ඔවුන් මිනිසුන් හා සම්බන්ධ වේ. බටහිර ලෝකයේ "අවතාර" වශයෙන් සඳහන් වන මෙම සංකල්පය බුදුසමය තුළ "අමනුස්ස" යනුවෙන් සඳහන් වීමෙන් නිගමනය වන්නේ ප්‍රස්තුත හොල්මන් අවතාර යනු මෙකී ජීවීන් ම වන බව යි.

**ප්‍රමුඛ පද** : අවතාර, අමනුස්ස, ප්‍රේත, යක්‍ෂ, රූප මවාගැනීම

1 පූර්ව උපාධි අපේක්‍ෂක - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය